# නිකායාන්තරිකයන්ගේ විනය පිටකය

## මහාචාර්ය ඔලිවර් අබේනායක

විනය පිටකයට හිමිකම් කිව හැක්කේ ථෙරවාදීන්ට පමණක් නොවේ. ද්විතීය සංගීතියෙන් පසු බෙදී ගිය අටළොස් නිකායයන්ගෙන් බොහෝවකට ඔවුනොවුන්ට අයත් ත්‍රිපිටක සාහිත්‍යයක් විය. දැනට අපට ලැබී ඇති මූලාශ්‍රය අනුව ථෙරවාදීන් හැර අනෙක් නිකාය සප්තකයකට අයත් විනය ග්‍රන්ථ පිළිබඳ තොරතුරු ලද හැකිය. නිකාය නාමයනුත් ඒ ඒ නිකායට අයත් විනය පිටකාගත ග්‍රන්ථත් පහත දැක්වේ.

**සර්වාස්තිවාද නිකායඃ- (6)**

1. දශාධ්‍යාය විනය,
2. විනයනිදාන (දශාධ්‍යාය විනයේ ප්‍රස්තාවනාව),
3. විනයමාතෘකා,
4. විනයවිභාෂා,
5. භික්ෂු ප්‍රාතිමෝක්ෂසූත්‍ර,
6. භික්ෂුණී ප්‍රාතිමෝක්ෂසූත්‍ර,

**මූලසර්වාස්තිවාද නිකායඃ- (11)**

1. මාතෘකා,
2. ප්‍රාමෝක්ෂසූත්‍ර,
3. භික්ෂුණීප්‍රාතිමෝක්ෂසූත්‍ර,
4. විනයසංයුක්තවස්තු,
5. විනයසංයුක්තවස්තු ගාථා,
6. විනයසංඝභේදක වස්තු,
7. විනය ගාථා,
8. විනයනිදානමාතෘකා ගාථා,
9. විනයසංග්‍රහ,
10. ඒකාෂ්ටකකර්මනිදාන,
11. ප්‍රව්‍රජ්‍යා උපසම්පදාකර්ම වාක්‍ය,

**ධර්මගුප්තිකනිකායඃ- (2)**

1. භික්ෂුවිනය,
2. භික්ෂුණීවිනය,

**මහිංසාසකනිකායඃ- (4)**

1. පඤ්චවර්ගවිනය,
2. විනයකර්මභික්ෂුප්‍රාතිමෝක්ෂ,
3. භික්ෂුණී ප්‍රාතිමෝක්ෂ,

**කාශ්‍යපීයනිකායඃ-(1)**

ප්‍රාතිමෝක්ෂසූත්‍ර

**සම්මිතීයනිකාය:-(1)**

ද්වාවිංශතිප්‍රසන්නායථිශාස්ත්‍ර

ඉහත කී විනය පිටක සප්තකයෙන් ථෙරවාදීන්ගේ විනය පිටකය සමග බොහෝදුරට සැසඳෙන්නේ **මහීශාසකනිකායට අයත් විනය පිටකයයි**. මහීශාසක විනයෙහි ප්‍රථම කාණ්ඩය පරාජික, සංඝාදිසෙස, අනියත, නිස්සග්ගිය, පාචිත්තිය යන ශික්ෂාවන් පිළිබඳ විස්තර සපයයි. එහි දෙවන කාණ්ඩය භික්ෂුණීන්ගේ එම ශික්ෂාවන් ගැන විස්තර සපයයි. මහීශාසකයන් භික්ෂු භික්ෂුණීන් සඳහා ශික්ෂා වෙන වෙනම ග්‍රන්ථ දෙකක සංග්‍රහ කොට ඇත. මහීශාසක විනයෙහි තෙවැනි කාණ්ඩය බුද්ධචරිතය, පබ්බජ්ජාව යනාදිය ගැන විස්තර කරයි. සිව්වන කාණ්ඩයෙහි අධිකරණසමථ, සංඝකර්ම හා ප්‍රථම ද්විතීය සංගායනා ගැන කරුණු සටහන් වී ඇත. පස්වැනි කාණ්ඩය විනය නීති පිළිබඳ ප්‍රකීර්ණක සංග්‍රහයකි. මේ අනුව මහීශාසක විනයෙහිලා සංග්‍රහ වී ඇත්තේ උභතො විභංග, ඛන්ධක, පරිවාර යන පාළි විනය පිටකයේ ග්‍රන්ථයන්හි එන කරුණුය.

ඉහත ඉදිරිපත් කරනලද ග්‍රන්ථවලට අමතරව හීනයානික විනය ග්‍රන්ථ ගැන තොරතුරුද දත හැකිව තිබේ. **නන්ජිඕ මහතා** හීනයානික විනය ග්‍රන්ථ පිළිබඳ චීන පිටපත් හැටක සමාලෝචනයක් ඉදිරිපත් කොට ඇත. ඒ නාමාවලියේ එන **බුද්ධාභිධර්ම සූත්‍ර, උපාලිපුච්ඡා සූත්‍ර, බුද්ධභාෂිත-උපාසක-පඤ්චසීල-රූපසූත්‍ර** ආදී ග්‍රන්ථ අයත් කරව නිකායකටදැයි හඳුනාගත නොහැකිය. ථෙරවාදීන්ගේ පරිවාරපාළියෙහි උපාලිපඤ්හ නමින් පරිච්ඡේදයක් දක්නට ලැබේ. ඉහත කී විනය ග්‍රන්ථ විනය පිටකාගත ග්‍රන්ථ නොව, විනය පිටකයට හීනයානික ආචාර්යවරයන් විසින් කරන ලද සංග්‍රහ ග්‍රන්ථ වශයෙන් හැඳින්විය හැකිය. වරින්වර ඉන්දියාවට පැමිණි චීන පයථිටක භික්ෂූන් මේ ග්‍රන්ථ ස්වදේශයට ගෙන ගොස් චීන භාෂාවට පරිවර්තනය කොට චීන විනය පිටකයෙහි ලා ප්‍රවිෂ්ට කරන්නට ඇත. වර්තමාන ථෙරවාද විනය පිටකයේ එන්නේ භික්ෂු භික්ෂුණීන් සඳහා පණවන ලද ශික්ෂා පමණය. එහෙත් උපාසක-උපාසිකා, සාමණේර-සාමණේරීන් සඳහා පණවන ලද ශික්ෂා ථෙරවාදීන් විසිනුදු වෙනම සංග්‍රහ කොට තබන ලද බව ඉහත කී බුද්ධභාෂිත **උපාසකපඤ්චසීල රූපසූත්‍ර** නම් ග්‍රන්ථනාමය දෙස බලන විට පෙනී යයි. මේ කරුණු වඩාත් වැදගත් වන්නේ නිකායාන්තරිකයන්ගේ විනය සාහිත්‍යයෙහි සාමණේර උපාසක දෙපක්ෂය සඳහා පණවන ලද ශික්ෂා සංග්‍රහ කරන ලද විනය ග්‍රන්ථ දක්නට ලැබෙන හෙයිනි.

මහායාන නිකායට අයත් විනය ග්‍රන්ථ පිළිබඳ නාමාවලියක් ද නන්ජිඕ මහතා විසින් සපයා ඇත. මහායානික විනය සාහිත්‍යය ග්‍රන්ථ විසි පහකින් පමණ පරිමිත බව ඒ අනුව පෙනී යයි. මහායානිකයෝ බෝධිසත්වවරුන් සඳහා වූ ශික්ෂාපද ඔවුන්ගේ විනය ග්‍රන්ථවල සංග්‍රහ කළහ. මහායානික විනය සාහිත්‍ය පිළිබඳ සෑහෙන තරම් අධ්‍යයනයක් මේ තාක් සිදු වී නැත. නිකායාන්තරිකයන්ගේ විනය සාහිත්‍යය ගැන අවධානය යොමු කළ උගතුන්ගේ විශේෂ අවධානය යොමු වී ඇත්තේ **සර්වාස්තිවාද, මූලසර්වාස්තිවාද** නිකාය දෙකෙහි කෘති වෙතය. විශේෂයෙන් විනය වස්තුව ගැන කරන ලද අධ්‍යයනයෝ බොහෝ වෙති.

නිකායාන්තරිකයන්ගේ විනය සාහිත්‍යයෙන් වැඩි කොටසක් දනට ලැබී ඇත්තේ **චීන සහ ටිබෙට්** පරිවර්තන මාර්ගයෙනි. නිකායාන්තරිකයන්ගේ මූල භාෂා මාධ්‍යය යයි සිතිය හැකි සංස්කෘත භාෂාවෙන් මෙතෙක් ලැබී ඇති පිටපත් සංඛ්‍යාව සීමිතය. කාශ්මීරයේ ගිල්ගිට් නම් ස්ථානයෙන් විනයවස්තු, ප්‍රතිමෝක්ෂසූත්‍ර, කර්මවාක්‍ය යන ග්‍රන්ථයන්ගේ සංස්කෘත පිටපත් ලැබී ඇත. රාහුල සංස්කෘත්‍යායන පණ්ඩිතුමා විසින් ටිබෙට් දේශයෙන් විනයසූත්‍ර, විනය සූත්‍ර ටීකා, ප්‍රාතිමෝක්ෂ සූත්‍ර, ප්‍රාතිමෝක්ෂ සූත්‍ර ටීකා, භික්ෂු ප්‍රකීර්ණ, ශ්‍රාමණේර ටීකා, උපසම්පදා ප්‍රඥප්ති යන ග්‍රන්ථයන්ගේ සංස්කෘත පිටපත් සොයා ගෙන ඇත. මේ හැර සංස්කෘත මාධ්‍යයෙන් අනෙක් වැදගත් නිකායාන්තරික විනය කෘතියක් ලැබී නැත.

චීන භාෂා මාධ්‍යයෙන් ලැබෙන මහායාන නිකායවලට අයත් විනය ග්‍රන්ථ සංඛ්‍යාව අතිවිශාලය. ඒ අතර විනය පිටක කෘති පමණක් නොව විනය සංග්‍රහ ග්‍රන්ථ ද වේ. නිකායාන්තරික විනය චීන භාෂාවට පරිවර්තනය කිරීමෙහිලා අතිවිශාල සේවයක් සිදුවූයේ ෆාහියන් ගෙන් සහ ඉත්සිං ගෙනි.

ෆාහියන් සහ ඉත්සිං ඉන්දියාවට පැමිණියේ විනය ග්‍රන්ථයන්හි පිටපත් චීන දේශයට ගෙන යෑමේ හුදු අභිප්‍රායෙනි. මහාසාංඝික විනය චීන භාෂාවට පරිවතර්නය කරන ලද්දේ ෆාහියන් විසිනි. හෙතෙම ලංකාවෙන් ද මහාසාංඝික නිකායට අයත් විනය පිටකයක් ලබා ගත්තේය. දැනට කිසිදු භාෂාවකින් දක්නට නැති පද්‍යයෙන් රචනා කොට තිබූ සර්වාස්තිවාද නිකායට අය්ත විනය ග්‍රන්ථයක් ගැන ද ෆාහියන් කරුණු ඉදිරිපත් කො ඇත්තේය. මූල සර්වාස්තිවාද විනය චීන භාෂාවට පරිවර්තනය කරන ලද්දේ ඉත්සිං විසිනි. හෙතමෙ මූලසර්වාස්තිවාදය පදනම් කොට ගෙන භික්ෂූන්ගේ ආරාමික ජීවිතය පිළිබඳ විවේචනාත්මක ග්‍රන්ථයක් ද රචනා කළේය. ඔහු විසින් චීන භාෂාවට පරිවර්තනය කරන ලද ග්‍රන්ථ සංඛ්‍යාව බෙහෙවින් විශාලය. නිකායාන්තරිකයන්ගේ විනය ග්‍රන්ථ පමණක් නොව අනෙක් ත්‍රිපිටක ග්‍රන්ථ සියල්ලක්මත් චීන භාෂාවට පරිවර්තනය කරන ලද අයගේ නම් පරිවර්තනය කරන ලද දිනවකවානු ද එම ග්‍රන්ථයන්හිම සඳහන් කොට තිබෙන බව මෙහිදී විශේෂයෙන් සැලකිල්ලට ගත යුතුය.

ටිබෙට් විනය පිටකය **දුල්වා** නමින් හැඳින්වේ. සංස්කෘත භාෂාවෙන් පරිවර්තනය කරන ලද සියලුම විනය ග්‍රන්ථ දුල්වා සංස්කරණයෙහි ලා ප්‍රවිෂ්ට කොට ඇත. **විනයවස්තු, ප්‍රාතිමෝක්ෂසූත්‍ර, විනයවිභංග, භික්ෂුණී ප්‍රාතිමෝක්ෂ භික්ෂුණී විනයවිභංග, විනය ක්ෂුද්‍රක වස්තු, විනය උත්තර ග්‍රන්ථ** යනු විසින් දුල්වා විනයෙහි එන කාණ්ඩ දහතුන කොටස් කර දක්වා ඇත්තේය. නලිනාක්ෂදත්ත පඬිතුමා දුල්වා විනය කොටස් සතරෙක්හි ලා සංග්‍රහ කොට ඇත. විනයවස්තු, ප්‍රාතිමෝක්ෂසූත්‍ර හා විනවිභංග විනයක්ෂුද්‍රකවස්තු විනය උත්තරග්‍රන්ථ යනුවෙනි. දුල්වා විනය, **පාලි විනය ග්‍රන්ථයන්ට බොහෝදුරට සමානව පවතින බව** ඒ පිළිබඳ විමසූ උගතුන්ගේ මතයයි. ටිබෙට් විනය පිටකය මූලසර්වාස්තිවාද නිකායට අයත් සේ සැලකෙයි. දුල්වා විනයෙහි ලා ප්‍රවිෂ්ට වී ඇති විනයවස්තුව සර්වඥදේව, ධර්මාකර යන භික්ෂූන්ගේ පරිවර්තනයකි. එයට උපදෙස් දුන්නේ විද්‍යාකරප්‍රභා නම් හිමි නමකි. මේ පරිවර්තනය ක්‍රි.ව. 9 වෙනි සියවසට අයත්ය යි සලකනු ලැබේ.

සංස්කෘත මාධ්‍යයෙන් දක්නට ලැබෙන අනෙක් විනය ග්‍රන්ථයක් වෙතද අපේ අවධානය යොමු විය යුතුය. ඒ කෘතිය නම් **මහාවස්තුව** යි. එහි සංස්කෘත පිටපතද ඉංග්‍රීසි පරිවර්තනයද මුද්‍රණය කොට තිබේ. මහාවස්තුව මධ්‍යදේශයේ ලෝකෝත්තරවාදී මහාසාංඝික නිකායට අයත් විනය ග්‍රන්ථයක් වශයෙන් සලකනු ලැබේ. මහාවස්තුව විනය ග්‍රන්ථයක් වශයෙන් සැලකුවද එහි භික්ෂු විනය සම්බන්ධයෙන් කරුණු දක්වෙන්නේ අල්ප වශයෙනි. එය බුද්ධචරිතය සංග්‍රහ කරන ලද ග්‍රන්ථයකි. දීපංකර පාදමූලයේ පටන් ගෞතම බුදුන්වහන්සේ පෙරුමදම්පිරූ සැටිත් ගෞතම බුදුන්වහන්සේ භික්ෂුශාසනය ප්‍රතිෂ්ඨාපනය කළ අයුරුත් එහි දක්වේ. පාළි ත්‍රිපිටකයේ නොයෙක් සූත්‍රයන්හි සංස්කෘත පරිවර්තන මහාවස්තුවෙහි ලා ආරක්ෂා වී ඇත. බුදුන්වහන්සේට සමකාලීනව විසූ ඇතැම් තෙරවරුන්ගේ චරිතකථාද එහිලා සංග්‍රහ වී ඇත. එහෙයින් මහාවස්තුව අවදාන ශෛලියේ ආභාසයෙන් රචිත කෘතියක ස්වරූපය ද දරයි.

පාළි විනය පිටකයෙහි එන උභතො විභංග, ඛන්ධක, පරිවාර කොටස් අනෙක් නිකායාන්තරිකයන්ගේ විනය පිටකය සම්බන්ධයෙන් ද පොදුය. එහෙත් නිකායාන්තරිකයන්ගේ විනය පිටකය ථෙරවාදීන්ගේ පිනය පිටකයට වඩා සංවර්ධිත අවස්ථාවක් පිළිබිඹු කරයි. එය පාළි විනය පිටකයට වඩා අතිශයින් විස්තීර්ණ; ග්‍රන්ථසංඛ්‍යාවෙන් ද අධිකය. නිකායාන්තරිකයන්ගේ ආගමග්‍රන්ථ ථෙරවාදීන්ගේ ආගම ග්‍රන්ථ (නිකාය ග්‍රන්ථ) සමග බොහෝදුරට සැසඳෙයි. එහෙත් විනය පිටකය එපමණ දුරට නොසැසඳෙයි. බුදුන් වහන්සේගේ සමයෙහිදීම විනයධර භික්ෂූහු භික්ෂු සමාජයේ පහල වූහ. ඔවුහු බුද්ධපරිනිර්වාණයෙන් පසු ගුරුකුලයන් හැටියට සංවර්ධනයට පත් වූහ. ඔවුනතර විනය පිළිබඳ ස්වාධීන මත දරන්නෝ ද වූහ. පශ්චාත්කාලයක මේ මතවාද ක්‍රමයෙන් දියුණු විය. නිකායභෙදය පහල වීමටත් ධර්මවිනය වරින්වර සංගායනා කිරීමටත් හේතු වූයේ විනය කරුණු සම්බන්ධයෙන් මේ අන්දමට ඇති වූ විවිධ මතිමතාන්තරය. නිකායාන්තරිකයන්ගේ විනය පිටකයෙහි සංග්‍රහ වී ඇත්තේ ස්වාධීන සම්ප්‍රදායයන් වශයෙන් වැඩිදියුණු වූ ඒ මතවාදය. ථෙරවාදීන් සහ අනෙකුත් නිකායිකයන් අතර විනය විෂයෙහි සමීප සම්බන්ධකමක් දක්නට නොලැබෙන්නේ ද මේ නිසාය.

චීන විනය පිටකයේ සියලුම සංස්කරණවල භික්ෂුප්‍රාතිමෝක්ෂයෙහි එන ශික්ෂාපදයන්ගේ සංඛ්‍යාව දෙසිය පණහ (250) කි. විනය පිටකයේ ටිබෙට් සංස්කරණයෙහි එන පරිදි ශික්ෂාපද සංඛ්‍යාව දෙසිය පණස් අට (258) කි. පාළි විනය පිටකයට අනුව භික්ෂූන් විසින් ආරක්ෂා කළ යුතු ශික්ෂාපද දෙසිය විසිහත (227) ක් ඇත්තේය. ශික්ෂා සංඛ්‍යාව සම්බන්ධයෙන් ඉහත කී සංස්කරණවල විසදෘශතා දක්නට ලැබෙන්නේ සෙඛියා හා පාචිත්තිය ධර්ම පිළිබඳවය. පාළි විනය පිටකයේ සෙඛියා හැත්තෑ පහ (75) ක් දක්වා ඇත්තේය. දුල්වා විනය පිටකයෙහි සේඛියා සංඛ්‍යාව එකසිය හය (106) කි. චීන සංස්කරණයන්හි සෙඛියා ධර්ම සියය (100) ක් දක්වා ඇත්තේය. මහාව්‍යුත්පත්ති නම් මහායානග්‍රන්ථයේ සෙඛියා අසංඛ්‍ය බව දක්වා ඇත. පාළි විනය පිටකය පාචිත්තිය ධර්ම අනූදෙක (92) ක් දක්වා ඇති තඅර චීන සංස්කරණවල එන්නේ අනූව (90) කි. මිලින්දප්‍රශ්නයේත් අංගුත්තරනිකායේත් දැක්වෙන අන්දමට ශික්ෂාපද සංඛ්‍යාව එකසිය පණහක් (150) ක් පමණ වේ. පඤ්චසතිකක්ඛන්ධකයේ ද සෙඛියා ධර්ම ගැන කිසිදු සඳහනක් ද නැත. සෙඛියා ශික්ෂා වශයෙන් සැලකීමට තරම් වැදගත් නොවන බව එමගින් වාච්‍ය වෙයි. චීන සංස්කරණවලින් එහි දැක්වෙන සෙඛියා ධර්ම ඉවත් කළ කල්හි මිලින්ද ප්‍රශ්නයේත් අංගුත්තරනිකායේත් ප්‍රකාශ වන අන්දමට 'දියඩ්ඪසික්ඛාපදසතං' යන ප්‍රමාණයට සරිලන පරිදි විනය ශික්ෂා එකසිය පණහ (150) ක් චීන විනය පිටකයෙන් අපට ලැබේ.

උපුටා ගැනීම:- ත්‍රිපිටක සාහිත්‍යය ඉතිහාසය - 1

විනය පිටකය, පිටු 41-45